Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

9 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ඉරි ඇඳි පදයට වඩාත් සමීප අර්ථය ඇති පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

01 කළු වරද හෙළිවීමෙන් ඔහුගේ සායම ගියා'යි කෙනෙකු පවසනු මට ඇසුණි.

(i) තීන්ත සේදී ගිය බව (ii) ගෞරවය විනාශ වූ බව

(iii) වැරදිකරුවෙකු වූ බව (iv) සමතයකට පත් වූ බව

02 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද දෙකක් වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(පිළිවෙළ / විශ්මය / පාපිෂ්ඨ / සමස්ථ / කනිෂ්ඨ)

(i) ............................................................ (ii) ............................................................

03 පහත දැක්වෙන නාම පදය හා ක්‍රියා පදය ඉදිරියෙන් ඇති තිත් ඉර මත සුදුසු විශේෂණ පද ලියන්න.

(i) .......................................... නිවේදිකාව (ii) ........................................................ ප්‍රකාශ කරයි.

- **අංක 04 හා 05 ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන වියරණ වර්ගයට අයත් වේදැයි තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

04 සමහරෙක් කාලයෙන් නිසි ප්‍රයෝජන ගනිති.

(i) උපසර්ග පදයකි. (ii) නිත්‍ය බහු වචන පදයකි.

(iii) අනුක්ත පදයකි. (iv) නිපාත පදයකි.

05 හිතල බලලා වැඩ කරන්න යැයි අම්මා නංගීට නිතර පවසයි.

(i) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි. (ii) මිශ්‍ර ක්‍රියාවකි. (iii) උපසර්ග පදයකි. (iv) යුගල පදයකි.

06 පහත දැක්වෙන උක්ත පදවලට ගැළපෙන අනුක්ත පදය තිත් ඉර මත ලියන්න.

(i) මිනිසා - ........................................................ (ii) කාන්තාවක් - ........................................................

07 බහු අර්ථ පද පමණක් ඇති පද පේළිය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(i) කර, දන, වත, දද (ii) ජලජ, පංකජ, අණ්ඩජ, ජලාබුජ

(iii) ජලය, උදක, පැන්, සිලිල (iv) දෙස, බස, රැස, දොස

08 පහත දී ඇති වාක්‍ය නිදොස් කොට තිත් ඉර මත ලියන්න.

පියාණෝ රැස්වීමට සහභාගි විය.

..........................................................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

09 පහත සඳහන් වාක්‍යාංශවලට ගැළපෙන තනි පද තිත් ඉර මත ලියන්න.

(i) බොහෝ ඇසූ පිරූ තැන් ඇති - ..........................................................................................................

(ii) අහසත් පොළොවත් එකට ගැවෙන සේ පෙනෙන ස්ථානය - ..........................................................................

10 වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) මල් පොකුරු සුවඳ විහිදවමින් සුළඟට .................................................. (සෙලවෙයි / සෙලවෙති)

(ii) අයෙක් මිහිරි වීණා නාදයට ................................................................... (සවන්දෙයි / සවන්දෙති)

11 පහත සඳහන් පදවල අර්ථය තිත් ඉර මත ලියන්න.

(i) නුවන - ..................................................  (ii) නුවණ - ..................................................

12 පහත සඳහන් වාක්‍යයෙහි විරාම ලකුණු යොදා තිත් ඉර මත නැවත ලියන්න.

රාත්‍රි ආහාරයට පසු මෙම පෙති කරල් බොන්න

..........................................................................................................................................................

13 පහත සඳහන් ග්‍රන්ථ නාමයන් අකාරාදි පිළිවෙළට සකස්කර තිත් ඉර මත නැවත ලියන්න.

1. සද්ධර්මරත්නාවලිය  2. පූජාවලිය  3. බුත්සරණ  4. අමාවතුර

(i) ..........................................................  (ii) ..........................................................

(iii) ..........................................................  (iv) ..........................................................

14 මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පද දෙක බැගින් වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

( පතල / ස්වර්ණ / අරණ / රුවනාර / පරසිදු / කසුන් )

(i) රත්තරන්  1. ..........................................  2. ..........................................

(ii) ප්‍රසිද්ධ  1. ..........................................  2. ..........................................

15 ක්‍රියා පදයකට ඉදිරියෙන් 'නො' නිපාතය හා නාම පදයකට ඉදිරියෙන් 'අව' උපසර්ගය යොදා සෑදෙන විරුද්ධාර්ථ පද දෙකක් ලියන්න.

(i) නො ................................................  (ii) අව ................................................

- **ප්‍රශ්න අංක 16 සිට 18 තෙක් ඇති ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(අපනයනය / සාරවත් / ආනයනය / ජීවන / අභිවෘද්ධියට)

16 පරාක්‍රමබාහු රජ සමයේ මෙරටින් සහල් ...................................... කළ බව ඉතිහාස පොත පතේ සඳහන් වේ.

17 ඒ. වි. සුරවීර මහතා සභාව අමතා ....................................................................... දේශනයක් පැවැත්වූයේ ය.

18 සත් සමුදුර පිළිබඳව ...................................................................... අත්දැකීම් බහුලව ඇත්තේ මුහුදු යන්නාට ය.

- **පහත සඳහන් කවිවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

19 සිය පිරිවර රට තොට හැම වස්තුව නැත  නිම්මා

.................................................................................

තරු පිරිවර පුන් සඳ මෙන් වන මැද උන්  නෙම්මා

.................................................................................

20 මල්වල සුමිහිරි  පැනි

ඇද බොන බමරා  මෙනි

.................................................................................

.................................................................................

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**9 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.**

01 (i) ළමා පරපුරේ ඥාණය හා රසඥතාව වර්ධනය උදෙසා කුමාරතුංග මුණිදාස මහතා අතින් ලියවුණු කෘති දෙකක නම් ලියන්න.

(ii) ධීවර භාෂාවේ යෙදෙන පහත සඳහන් වචනවල අදහස ලියන්න.

(අ) ඉයත්තුව (ආ) මාරියාව

(iii) ස්වභාවෝක්ති හා අතිශයෝක්ති යන වචන දෙකෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ''දෑසේ නිල් පැහැය'' පද්‍ය පන්තිය උපුටාගත් පද්‍ය සංග්‍රහය හා එහි කතුවරයාගේ නම ලියන්න.

(v) ''දත් කැකුළු පාලා - සුරතල් සිනා සීලා

බොළඳ බස් දීලා - කෙළී සියොළඟ දූලි ගාලා''

මෙම පද්‍ය ඇතුළත් මුල් ග්‍රන්ථය හා කතුවරයා කවුද?

(vi) නිවැරදි වචන උච්ඡාරණය පුරුදු පුහුණු කිරීම සඳහා භාවිතා කරන ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

(vii) සිංහල ළමා සාහිත්‍යයේ ආරම්භක අවධියේ දායකත්වය සැපයූ නිර්මාණකරුවන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) පාසල් ජීවිතයේ දී ආනන්ද කුමාරස්වාමි ශිෂ්‍යයා ඉගෙනීමට අමතරව දස්කම් පෑ ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(ix) ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ගත කළ පෞරාණික භෞතික විද්‍යාවට හා විද්‍යා ප්‍රබන්ධවලට දැඩිව ඇලුම් කළ ශිෂ්‍යයෙකු ලෙස ප්‍රසිද්ධියට පත් පුද්ගලයා කවුද? ඔහුගේ විශිෂ්ඨත්වය විදහා පෙන්වූ අවස්ථාව කුමක් ද?

(x) පැරණි සම්භාව්‍ය කෘති දෙකක නම් ලියන්න. (ලකුණු 1 x 10 = 10)

02 පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් තෝරාගෙන වචන 200 කට නො අඩු රචනාවක් ලියන්න.

(i) දිනෙන් දින ඉහළ යන අපරාධ රැල්ල

(ii) තාක්ෂණික දියුණුව මිනිස් යහපතට යොදවමු.

(iii) කියවීමේ අගය

(iv) දෙස බස රැස රැකගනිමු.

(v) මට ලොතරැයි දිනුමක් ලැබුණොත් (ලකුණු 20)

03 පෙළ පොතේ ඇතුළත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''මා එය දැනගෙන එනතුරු සතුටින් සිටිනු මැනවි''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද?

(ii) ''එසේ වීනම් මාත් ඒ බොන්ට වුව මැණව''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) ''ඔඩි හෙලයි හෙලයියා ..... කියමින් ධීවරයෝ වෙරළේ සිට දැල් අදිති.''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය රචනා කළ ලේඛකයාගේ නම ලියන්න.

(ආ) ධීවරයන් දැල් අදින විට ගායනා කරන කවි හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iv) පෞද්ගලික ලිපියක දක්නට නොමැති රාජකාරී ලිපියක දැකිය හැකි ආකෘතික ලක්ෂණ දෙකක් ලියන්න.

(v) ''මේ ශ්‍රේෂ්ඨ ගුරුවරයාගේ මානව දයාව තම ගෝලබාලයින් දිරිමත් කරන්නට සමත් උණා''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මානව දයාවෙන් පිරි මෙහි සඳහන් ගුරුවරයා කවුද? (ලකුණු 2 x 5 = 10)

04 ඔබ පාසලේ පුස්තකාලයට අලුතින් පොත් ලබාදීම සඳහා අනුග්‍රාහක භවතුන් කීපදෙනෙකුම ඉදිරිපත් වී ඇති බැවින් පුස්තකාලයට මිලදී ගැනීමට අවශ්‍ය පොත් සඳහා මිල ගණන් පිළිබඳ විස්තර දන්වා එවන ලෙස කොළඹ මරදාන පිහිටි ''විශ්ව පොත් හලේ'' කළමනාකාර තුමා වෙත යවන ලිපිය ලියන්න. මෙහිදී ඔබ පුස්තකාල පාඨක සමාජයේ ලේකම් යැයි සිතන්න. (ලකුණු 10)

05 පහත සඳහන් කර්තෘ කාරක වාක්‍යය කර්ම කාරක වාක්‍ය බවට හරවා නැවත ලියන්න.

(i) සංවිධායකයෝ අපව පිළිගත්හ.

(ii) ජනාධිපතිතුමා ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් පත් කරයි.

පහත සඳහන් වාක්‍යය නිදොස් කොට ලියන්න.

(iii) ඇතැමෙක් ගායනයට දක්ෂ විය.

(iv) අලි රංචුව වගාවන් පාලු කරයි.

(v) ගස් පෙළ සුළඟට සෙළවෙති. (ලකුණු 2 x 5 = 10)

06 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල ළමා සාහිත්‍යයක් පිළිබඳ පැහැදිලි සාධක අපට හමුවන්නේ විසිවන සියවසේ සිටය. යටත් විජිත සමයේ අධ්‍යාපනය පිළිබඳව වර්ධනය වූ ප්‍රබෝධය ළමා සාහිත්‍ය නිර්මාණ බිහිවීමට මූලිකව බල පෑ බව වියතුන්ගේ මතයයි. ළමයින් සඳහා ප්‍රථම සිංහල මුද්‍රිත කෘතිය ලෙස සැලකෙන්නේ ඩබ්. වී. අන්දිරිස් අප්පුහාමි ලියූ හෝඩි පොතයි. ළමයින්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලියැවුණු බාලාවබෝධනය, නන්දන හෝඩිපොත, නොදන්නා හෝඩිපොත ආදී හෝඩිපොත් ඇසුරෙන් නූතන සිංහල ළමා සාහිත්‍ය ඇරඹුණු බව විශ්වාස කෙරේ. පන්ති කාමරයේ කියවන පොත්වලට අමතරව අතිරේක කියවීම් සඳහා පොත් බිහිවීම ඔස්සේ සිංහල ළමා සාහිත්‍යය වර්ධනය විය.

(i) ළමා සාහිත්‍යය නිර්මාණ බිහිවීමට මූලික හේතුව කුමක් ද?

(ii) ළමයින් සඳහා රචිත ප්‍රථම මුද්‍රිත සිංහල කෘතිය හා කතුවරයා දක්වන්න.

(iii) ළමා සාහිත්‍යය පිළිබඳ පැහැදිලි සාධක හමුවන්නේ කුමන කාලයක ද?

(iv) ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලියවුණු පොත් දෙකක් උපුටා දක්වන්න.

(v) නූතන ළමා සාහිත්‍යය ආරම්භ වූ බව ප්‍රකාශවන්නේ කුමකින් ද? (ලකුණු 2 x 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) i (02) පිළිවෙළ, කනිෂ්ඨ
(03) නාම පදයට හා ක්‍රියා පදයට ගැළපෙන සේ නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
(04) ii (05) iv (06) i. මිනිසා ii. කාන්තාවක (07) i
(08) පියාණෝ රැස්වීමට සහභාගි වූහ. (09) i. බහුශ්‍රැත ii. ක්ෂිතිජය
(10) i. සෙලවෙයි ii. සවන්දෙති (11) i. ඇස ii. ඝ්‍රාණය
(12) රාත්‍රී ආහාරයට පසු මෙම පෙති/කරල් බොන්න.
(13) i. අමාවතුර ii. පූජාවලිය iii. බුත්සරණ iv. සද්ධර්ම රත්නාවලිය
(14) i. ස්වර්ණ, කසුන් ii. පතල, පරසිඳු
(15) අර්ථවත් ගැළපෙන වචනයක් යොදා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
(16) අපනයනය (17) හරවත් (18) ජීවන
(19) එදලොබ හැර ඔබ සමගින් තපසට ආවෙ මිමා
වෙසතුරු පිය රජුනි ඔබට බාරයි අපෙ අම්මා
(20) හොඳ ළමයා නුවණිනි - හොඳ දේ තෝරාගනී (මුළු ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) ශික්ෂා මාර්ග, කියවන නුවණ, හත්පන, මඟුල්කෑම, හීන්සැරය මින් දෙකක් ඇත්නම් ලකුණු ලබාදෙන්න.
(ii) (අ) ඉයත්තුව - කාලගුණය (ආ) මාරියාව - මුහුදු රළ
(iii) යමක් ඇති සැටියෙන් දැක්වීම ස්වභාවෝක්තියයි. ඇති තතු ඉක්මවා දැක්වීම අතිශයෝක්තියයි.
(iv) රන් තැටියක කඳුළු - දයාසේන ගුණසිංහ මහතා
(v) කාව්‍යශේඛරය - තොටගමුවේ රාහුල හිමි
(vi) සකස්කඩ, හිතෝපදේශය, ප්‍රත්‍යශතකය
(vii) වී. ඩී. ද ලැනරෝල්, කියවෝර් ජී. පෙරේරා, කුමාරතුංග මුණිදාස (13 පාඩම බලන්න)
(viii) උස පැනීම, පාපන්දු ක්‍රීඩාව, සාහිත්‍ය සංගමයේ දේශකයෙකු වීම, සඟරාවලට ලිපි ලිවීම ආදිය (12 පාඩම කියවන්න)
(ix) ස්ටීවන් හෝකිස්
ආබාධයෙන් පෙලුනද ප්‍රථම පන්ති සාමාර්ථයක් සහිතව ස්වභාවික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය ලබාගැනීම
(x) ජාතක කතා පොත, සද්ධර්මරත්නාවලිය, කාව්‍යශේඛරය, සියබස්ලකර ආදී පුරාතන කෘති දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 1 x 10 = 10)

02 කරුණුවල සාරවත් බව (ලකුණු 08)
නිර්මාණාත්මක බව (ලකුණු 07)
ඡේද වෙන්කිරීම, අත් අකුරු, අක්ෂර වින්‍යාසය, නිවැරදි වියරණය (ලකුණු 05) මුළු ලකුණු 20 කි.

03 (i) (අ) ශ්‍රී පාදය වැන්ද වූ හැටි (ආ) බාල පුතා විසින් තම මවට
(ii) (අ) මහධන සිටු පුත්හුගේ වස්තුව (ආ) මහධන සිටුවරයා විසින් ධූර්තයන්ට
(iii) (අ) ඔරුක්මාන් කුළමේ චන්දන හිමියන් (ආ) අම්බාවත් නමින්
(iv) 1. ලබන්නාගේ ලිපිනය සඳහන් කිරීම 2. මාතෘකාව යෙදීම
(v) (අ) දේශීය නර්තනයේ රන් සලකුණ (ආ) ආචාර්ය එස්. පණීභාරත මැතිතුමා
(ලකුණු 2 x 5 = 10)

04 (i) ලිපියේ ආකෘතිය සඳහා (ලකුණු 04)
(ii) ඡේද වෙන්කිරීම හා සංක්ෂිප්ත බව (ලකුණු 02)
(iii) අන්තර්ගතය (ලකුණු 02)
(iv) ශිල්පීය දක්ෂතා (ලකුණු 02) මුළු ලකුණු 10 යි.

05 (i) සංවිධායකයන් විසින් අපි පිළිගනු ලැබීමු. (ii) ජනාධිපතිතුමා විසින් ත්‍රිවිධ හමුදා ප්‍රධානීහු පත්කරනු ලබති.
(iii) ඇතැමෙක් ගායනයට දක්ෂ වූහ. (iv) අලි රංචුව වගාවන් පාලු කරති.
(v) ගස් පෙළ සුළඟට සෙලවෙයි. (ලකුණු 2 x 5 = 10)

06 (i) යටත් විජිත සමයේ අධ්‍යාපනය පිළිබඳව වර්ධනය වූ ප්‍රබෝධය නිසා
(ii) හෝඩිපොත - ඩබ්. වී. අන්දිරිස් අප්පුහාමි මහතා
(iii) විසිවන සියවසේ සිට
(iv) බාලාවබෝධනය, නන්දන හෝඩිපොත, නොදන්නා හෝඩිපොත
(v) ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලියවුණු පොත් ඇසුරෙන් (ලකුණු 2 x 5 = 10)